# 2025 අගෝස්තු මස මාසික සභා රැස්වීම් වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

දිනය - 2025.08.21

වේලාව - පෙ.ව. 10.00

පැමිණීම

| | නම | | තනතුර |
|---|---|---|---|
| I. | එච්.එල්.ජයසිරි | - | ගරු සභාපති |
| II. | ආර්.රජිත් ප්‍රියදර්ශන | - | ගරු උපසභාපති |
| III. | හර්ෂ උදයකුමාර ජයවීර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IV. | ආර්.කේ.එම්.රෝහිත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| V. | එම්.ඒ.ආරියසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VI. | එන්.ටී.චමින්ද ජයනාත් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VII. | පී.එම්.පී.අනුර ප්‍රියන්ත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VIII. | එම්.එල්.එම්.අසාර් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IX. | බී.කේ.නිලුකා කුමුදුනී | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| X. | ආර්.ඩබ්ලිව්.සිරිසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XI. | කේ.පී.තමිලා දිල්රුක්ෂි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XII. | පුදත් චමින්ද උයනගේවා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIII. | බී.ඩී.නිපුන ගයාශාන් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIV. | එස්.දයාසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XV. | ජේ.ඒ.තනුජා දිලානි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVI. | උදානි ලියනගේ | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVII. | ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVIII. | එච්.එල්.විරේන්ද්‍ර විරාජ් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

නොපැමිණීම :- ---

| | නම | | තනතුර |
|---|---|---|---|
| XIX. | එම්.එල්.එම්.හනීෆා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XX. | කේ.රත්න | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXI. | එල්.වයි.නුවන් චතුරංග | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXII. | එල්.ඒ.සුනිල් පියංකර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව,ගරු සභාපති , එච්.එල්.ජයසිරි මහතා විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස මාසික සභාව පැවැත්වෙන අද දින පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්,ලේකම්තුමිය හා මාධ්‍යවේදී ඒ.ඒ.ප්‍රේමසිරි මහතාත්

, රුක්මන් රත්නායක මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදි.

(අ) 2025.07.22 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

2025.07.22 වන දින පවත්වන ලද මහ සභා වාර්තාවේ යෝජනා අංක 02 ට අදාළව අදහස් දැක්වීම යටතේ "තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු LL-7379 ගලි බවුසර රථයට අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේ දී, මිල ගණන් කැඳවීම නිසි ආකාරයෙන් සිදු කිරීමෙන් අනතුරුව අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට " ලෙස සංශෝධනය කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් දන්වා සිටින ලදි.

ඒ අනුව 2025.07.21 දිනැති මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු එච්.එල්.ජයසිරි මහතා යෝජනා කරන ලදි. 2025.07.21 දිනැති මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා යෝජනා කළ අතර , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා</u>

මාසික මහ සභාවේ දී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම කෙටියෙන් දැක්වීම සිදු නොකර සම්පූර්ණ අදහස් දැක්වීම ඉදිරිපත් කිරීම පිළිබඳ අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන. - නැත

(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන.-

I. 2025.09.15 වන දින සිට 2025.09.21 වන දිනය දක්වා පළාත් පාලන සතිය පැවැත්වීමට නියමිත බැවින්, 2025.09.18 වන දින පැවැත්වීමට නියමිතව තිබූ සැප්තැම්බර් මස මාසික මහ සභාව 2025.09.23 වන දින පෙ.ව 10.00 පැවැත්වීමට කටයුතු යොදා ඇති බවට ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදි.

II. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය යොමු අංක PMI-WILL/1000/68 හා 2025.08.19 දිනැතිව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත යොමුකරන ලිපියට අදාළව , පළාත් පාලන සභිකවරියන්ගේ දිස්ත්‍රික් සංසදය පිහිටුවීම 2025 සැප්තැම්බර් මස 02 දින හම්බන්තොට මහ නගර සභා ශ්‍රවනාගාරයේ දී පෙ.ව .9.30 සිට ප.ව 01.30 දක්වා පැවැත්වෙන බවත් සියළු ම මන්ත්‍රීවරියන් සහභාගී වන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදි.

III. පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක HACLG/EST/03/Training හා 2025.08.20 දානැති ලිපිය මගින් දන්වා ඇති පරිදි 2025 ජාත්‍යන්තර තොරතුරු දිනයට සමගාමීව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්බන්ධව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන 2025.09.09 වන දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවැත් වීමට කටයුතු යොදා ඇති බැවින් ,පක්ෂයට අයත් නොවන වෙනත් පක්ෂ වලින් පත් වූ සභිකයන් දෙදෙනෙකුගේ නම් අදාළ විෂය නිලධාරි වෙත ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදි.

(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න. - නැත

(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.

- <u>ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>
- <u>මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

1. තිස්සමහාරාම නව ආයුර්වේද මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ අභ්‍යන්තර කාමර වෙන්කිරීමේ ව්‍යාපෘතිය සඳහා එම්.එස්.තිස්ස උදාර ගොවි සංවිධානය වෙත 10% රඳවුම් මුදල රඳවාගෙන ඉතිරි මුදල වන රු.1,160,222.61 ක මුදල ගෙවීම සඳහා සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

   එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
   එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

2. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්සමහාරාම සිගිති අසපුවේ දැනට සිසුන් 61 දෙනෙකු අධ්‍යාපනය ලබන අතර එහි සේවය කරනු ලබන ගුරුභවතුන් දෙදෙනාගෙන් එක් ගුරුතුමියක් වන කේ.පී.ජී ඩිලක්ෂි සඳමාලි මහත්මිය මෙ වන විට ප්‍රසූත නිවාඩු ලබාගෙන ඇත.(2025.06.14 දින සිට)
   පෙර පාසල පවත්වාගෙන යාමේ ප්‍රමිතීන් සැලකීමේ දී ගරු සිසු අනුපාතය වන 1:20 අනුපාතය යටතේ ළමුන් 61 වැනි අධික දරු පිරිසක් සඳහා එක් ගුරුවරියක් හට අධ්‍යාපන ලබාදීම අපහසු කාරුණක් වී ඇත.සභාව යටතේ පවතින අනෙකුත් පෙර පාසල් හයෙහි (6) ද සිසුන් ප්‍රමාණයට සාපේක්ෂව සේවයේ යොදවා ඇති ගුරුභවතුන් සංඛ්‍යාව අවම මට්ටමක පවතී.ඒ අනුව තිස්සමහාරාම සිගිති අසපුවෙහි ප්‍රසූත නිවාඩු ලද ගුරුතුමියගේ රාජකාරි ආවරණය කිරීමට ස්ථිර පෙර පාසල් ගුරුභවතුන් අතිරික්තව නොමැති වීම හේතුවෙන් ගහේයාය පෙර පාසලෙහි පුහුණු ගුරුවරියක ලෙස සේවය කරන ලද ,පෙර පාසල් ගුරු තනතුරෙහි බඳවාගැනීම පටිපාටියට අදාළව සුදුසුකම් සපුරන ලද කළණි උදේශිකා මෙය උක්ත නිලධාරිනිය නිවාඩු අවසන් කොට පැමිණෙන තෙක් සේවයේ යෙදවීමට ගරු සභාවට යෝජනා කරන අතරම , සභාව යටතේ වන උඩුවිල පෙර පාසලේ සේවයෙහි නියුතුව සිටින එස්.එල්.නිරෝෂා නිරංජනි මිය මෙ වන විට පිළිකා රෝගයෙන් පෙළීම හේතුවෙන් සේවයට වාර්තා කළ නොහැකි බැවින් එම නිලධාරිනියගේ රාජකාරි ආවරණය සඳහා ද උක්ත පෙර පාසලෙහිම දැනට පුහුණුව ලබන (පෙර පාසල් ගුරු බඳවාගැනීමේ පටිපාටියට අදාළව සුදුසුකම් සපුරා ඇති) කවිදි මන්තිලා මෙය අදාළ නිලධාරිනිය නිරෝගීව නැවත සේවයට වාර්තා කරන දින දක්වා සේවයේ යෙදවීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.ඒ අනුව කළණි උදේශිකා මෙය සහ කවිදි මන්තිලා මෙය දිනකට රු.1,000.00 ක දීමනාවක් ගෙවීම කිරීමේ පදනම මත 2025.10.01 දින සිට සේවයේ යෙදවීම සුදුසු බවටත් ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන අදාළ ගෙවීම් කටයුතු කිරීම සුදුසු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

   එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
   එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

3. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථානවල පිහිටි කඩ කාමර වල බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීමට 2025.08.11 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ අනුමැතිය හිමි වූ බැවින් එම කඩ කාමර වල බදු අයිතිය සංශෝධනය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | අංකය | දැනට බදු අයිතිය | පැවරීම | සම්බන්ධය |
|---|---|---|---|---|---|
| 01 | තිස්ස පැරණි බස් නැවතුම්පොළ කඩ කාමර | 04 | එස්.ජේ.සුමනාවති | එම්.එල්.ජේ.චමිල ප්‍රියදර්ශන | මවගෙන් පුතාට |
| 02 | දෙබරවැව පොදු වෙළඳපොළ | 31 | වයි.ජී.පියල් ගාමිණී | වයි.ජී.සිරිල් | එක්වන් මුදල් ගෙවා |
| 03 | දෙබරවැව පොදු වෙළඳපොළ | 39 | ඩී.ආර්.ජේ.ගුණසේකර | ජේ.එම්.සුමාලි වදුම්හිරිකා | එක්වන් මුදල් ගෙවා |
| 04 | දෙබරවැව පොදු වෙළඳපොළ | 36 | ඩබ්.ජී.එච්.සිරිසේන | ඩබ්.ජී.එච්.ප්‍රියංගිකා | පියාගෙන් දුවට |

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

4. 2025-08.11 පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ නිර්දේශය හිමි ව ඇති, ප්‍රාදේශිය සභාවේ කාර්යයන් සඳහා දරන ලද රු.100,000.00 වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ , පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබාදීම සුදුසුබවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ආයතනය | විස්තරය | බිල්පත් අංකය හා දිනය | මුදල |
|---|---|---|---|---|
| 01 | එල්.එච්.එස්.පී. කුමාර | සෞඛ්‍ය අංශයේ සේවකයින් සඳහා කෑම පාර්සල් ලබා දීම (2025 ජුනි මස) | 005/006 | 101,520.00 |
| 02 | මහ හැන්නදිගේ චන්ද්‍රලතා | ආරක්ෂිත තැන්පතු නිදහස් කිරීම | | 156,300.00 |
| 03 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | බවුසර් සැපයුම් සඳහා ජලය ලබාදීම වෙනුවෙන් 2025 ජුනි මස බිල්පත් පියවීම | 7780 | 157,766.00 |
| 04 | එස්.ජී.කේ සංජය සහ පී හර්ෂණ | ට්‍රැක්ටර් ටේලර් සකස් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | | 139400.00 |
| 05 | සුරංග හාඩ්වෙයාර් | කර්මාන්ත කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම (තට්ටුව සකස් කිරීම) | | 336,000.00 |
| 06 | ප්‍රියන්ත එන්ටර්ප්‍රයිසස් | තොග ඉන්ධන බවුසරය සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම | 01160 | 311,500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | සමාධි ටේලර්ස් | පියදුරු, විදුලි කාර්මික ශිල්පී සහ ආදාහනාගාර ක්‍රියාකරු නිල අඳුම් සඳහා ගාස්තු ගෙවීම | 025 – 25.08.04 | 115200.00 |
| 08 | ලේකම් | දෛනික රාජකාරි කටයුතු සඳහා යොදාගන්නා සේවකයින්ට ගෙවීම - ජූලි මස | | 538,650.00 |
| 09 | රුවන් මෝටර් වර්ක්ස් | RX-1556 මහ ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම | 0325 | 288,750.00 |
| 10 | තිළිණ මෝටර්ස් | 56-1099 කැබ් රථය අලුත්වැඩියා කිරීම | | 462,000.00 |
| 11 | ඉරේෂා ඉන්ධන පිරවුම්හල | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 4989/4990 - 5010/5011- 5023/5029- | 974,544.50 |
| 12 | ඉරේෂා ඉන්ධන පිරවුම්හල | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 5043/5037/ 5054/5055/ 5063/5071 | 805,827.50 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>කාර්මික සේවා කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

5. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් ඉදිරියේ දී සිදු කිරීමට නියමිත පහත දක්වා ඇති ව්‍යාපෘතීන්ට අදාළව සකස් කරන ලද ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | අරමුදල් ප්‍රභවය | ඇස්තමේන්තු මුදල |
|---|---|---|---|
| 01 | යෝධකණ්ඩිය ආයුර්වේද මධ්‍යස්ථානයේ වහලය සකස් කිරීම | පළාත් නිශ්චිත සහ සභා අරමුදල් | 3,638,159.53 |
| 02 | තිස්ස ආයුර්වේද මධ්‍යස්ථාන භූමිය කොන්ක්‍රීට් කුට්ටිගල් ඇතිරීම | සභා අරමුදල් | 378,183.30 |
| 03 | මහසෙන්පුර ආදාහනාගාරයේ තීන්ත ආලේපනය කිරීම | සභා අරමුදල් | 319,092.40 |
| 04 | ගණේයාය පෙර පාසලේ වහලය සහ සිවිලිම සකස් කිරීම | පළාත් නිශ්චිත | 550,000.00 |
| 05 | උද්ධකන්දර පෙර පසලේ සිවිලිම සකස් කිරීම සහ දෙවන ශාලාවෙහි ජනෙල් කවුලු ආවරණ සකස් කිරීම | පළාත් නිශ්චිත | 2,000,000.00 |

| | | | |
|---|---|---|---|
| 06 | මෝලකැපුපතාන පාසල පිටුපස කාපට් එක දක්වා මාර්ගය සහ ජයමාවතේ අතුරු මාර්ගය වන පී.කේ.කේ.සුධර්මා මහත්මියගේ නිවස අසල සිට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම. | පළාත් නිශ්චිත | 1,999,999.00 |
| 07 | පන්නගමුව රාජපක්ෂ මාවතේ සිට ඇලකණ්ඩිය දක්වා මාර්ගයේ ඉතිරි කොටස සහ පන්නගමුව ඇලකණ්ඩිය පාරේ පතිනායක කුමාර මහතාගේ නිවස අසල සිට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම. | පළාත් නිශ්චිත | 1,999,999.00 |
| 08. | මහසෙන්පුර ආදාහනාගාරය සඳහා ජලය සැපයීම | පළාත් නිශ්චිත | 815,280.29 |
| 09 | අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ජල සැපයුම සකස් කිරීම | පළාත් නිශ්චිත | 500,055.60 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

6. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සඳහා ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.63,464,795.89 ක ප්‍රතිපාදන හිමි වී ඇති බැවින් මෙම ව්‍යාපෘතිය සඳහා භාවිතා කරන ඉඩම මිනින්දෝරුවරයෙකු ලබා මැනීම කටයුතු සිදු කර ගෙවීම සිදු කිරීමටත්, ගොඩනැගිලි සැලසුම සකස් කර ගැනීම සඳහා පිටතින් සේවය ලබා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සඳහා ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ලක්ෂ 1640 සැලැස්මක් පළාත් පාලන අමාත්‍යංශය වෙත ඉදිරිපත් කළ අතර එම මුදලින් කොටසක් වන ලක්ෂ 634 ක මුදලක් මේ වන විට ප්‍රතිපාදන ලෙස හිමි වී ඇති අතර ඉතිරි මුදල ලබන වසර තුළ ලැබීමට නියමිත බවත් මෙම මුදල ලබාදීම සම්බන්ධයෙන් පළාත් පාලන අමාත්‍යංශය වෙත ස්තූතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදි.එසේම ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය ඉදිකිරීමේ සැලැස්ම තුළ අන්තර්ගතවන සුවිශේෂී කරුණු පිළිබඳ පැහැදිලි කිරීමක් සිදුකරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා</u>

2002 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් බවට අදහස් දක්වන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

2002 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිළිබඳව අදහස් දක්වන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

7. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව සඳහා ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.63,464,795.89 ක ප්‍රතිපාදන හිමි වී ඇති බැවින් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීමටත්, ප්‍රසම්පාදන කටයුතු පුවත්පත් දැන්වීමක් පළ කිරීම තුලින් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

8. ක්ලින් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ සංචාරකයින් සඳහා සනීපාරක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළේ වැසිකිලි පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා රු.17,177,757.19 ක ප්‍රතිපාදන මුදල් අනුමත වී ඇති බැවින් ප්‍රසම්පාදන කටයුතු පුවත්පත් දැන්වීමක් පළ කිරීම තුලින් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එල්.එම්.අසාර් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>පරිසර පොදු පහසුකම් කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

9. තිස්සමහාරාම නගරයේ කාණු පද්ධතිය සහ පන්නේගමුව,දෙබරවැව කාණු පද්ධතිය පිරිසිදු කිරීම සඳහා මිනිස් ශ්‍රම දින 92ක් අවශ්‍ය වන බැවින් ඒ සඳහා දිස්ත්‍රික් මිල ගණන් අනුව කම්කරුවන් 04 දෙනෙකුගේ සේවය පිටතින් ලබා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.
   - දෙබරවැව ,පන්නේගමුව කාණු පද්ධතියේ 800m ක් පිරිසිදු කිරීම සඳහා පවතින අතර දිනකට ඉන් 100 m ක් පිරිසිදු කිරීමට කම්කරුවන් 04කු අවශ්‍ය වන බැවින් ඒ සඳහා කම්කරු දින 32 ක් අවශ්‍ය වේ.
   - තිස්ස නගරයේ කාණු පද්ධතියේ 1500 m ක් පිරිසිදු කිරීම සඳහා පවතින අතර දිනකට ඉන් 100 m ක් දිනකට පිරිසිදු කිරීමට කම්කරුවන් 04 දෙනා බැගින් කම්කරු දින 60ක් අවශ්‍ය වේ.

පිටතින් සේවයේ යොදවා ගන්නා මෙම සේවකයින් සඳහා දිස්ත්‍රික් මිල ගණන් අනුව හෝ දෛනික පදනම මත ගෙවීම් කිරීම සභාව විසින් තීරණය කිරීම සුදුසු බවට ද යොජනා කරමි.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

මෙම සේවකයින් සඳහා දිස්ත්‍රික් මිල ගණන් යටතේ ගෙවීම් කිරීමට වඩා දෛනික පදනම මත ගෙවීම් කිරීම සභාවට වඩා ලාභදායි වන බැවින් ,දෛනික පදනම මත ගෙවීම් කිරීම ට බඳවා ගැනීම සිදු කිරීම වඩා යෝග්‍ය බව ද ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජේ.ඒ.තනුජා දිලානි මහත්මිය</u>

තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවේ සේවයේ නිරත ව සිටි සේවකයින් තිදෙනෙකු හමු වී සිය දුක් ගැනවිලි ඉදිරිපත් කළ බවත් ඉන් සේවකයින් දෙදෙනෙකු වසර පහකට ආසන්න කාලයක් සභාවේ සේවයේ යෙදී සිටි බවත් අනෙක් තැනැත්තා වසර දාහතකට ආසන්න කාලයක් සභාවේ සේවයේ යෙදී සිටි බවත් මේ වන විට මෙම සේවකයින් තිදෙනා සේවයෙන් ඉවත් කර ඇති බැවින් ඉල්ලීම් කරන ලද සේවකයින් තිදෙනා කාන්තාවන් වීම සහ වර්තමානයේ පවතින ආර්ථික ගැටළු

හේතුවෙන් මෙ පිළිබඳ අවධානය යොමු කර ඔවුන්ට සාධාරණයක් ඉටුකර දෙන මෙන් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදි.

❖ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

මෙම සේවකයින් පිළිබඳව සවිස්තරාත්මකව තොරතුරු නම් වඩා නිවරදි පිළිතුරක් ලබාදීම හැකියාවක් පවතින බවත්, තාවකාලිකව බඳවා ගැනීම් සිදුකළ අවස්ථාවේ දී ද වැඩි වශයෙන් අවස්ථාව ලබාදීම සිදු කරනු ලැබුවේද කලින් සේවයේ යෙදී සිටි සේවකයින් වෙනුවෙන් බවත් ප්‍රකාශ කරන ලදි.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා

මෙම සේවකයන් පිළිබඳ සවිස්තරාත්මකව තොරතුරු ඉදිරිපත් කිරිමට කටයුතු කරන්නේ නම් එය වඩා වැදගත් වන බව ප්‍රකාශ කරන ලදි.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා

කම්කරුවන්ට වඩා විධිමත්ව සලකණු ලැබුයේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව බවත් අප පාලන කාලයේ දී කිසිදු සේවකයෙක් සේවයෙන් ඉවත් කිරීම සිදු කර නොමැති බවත් නිශ්චිත සේවක පිරිසක් පමණක් බඳවා ගතහැකි බැවින් එය ඉක්මවා කටයුතු කළ නොහැකි බවත්, සේවක ප්‍රමණය වැඩි කර ගැනීම සඳහා මෙ වන විට ඉල්ලීම් කර ඇති බවත්,තාවකාලිකව හෝ බඳවා ගැනීමට අවස්ථාවක් ලද හොත් සේවකයින් බඳවා ගැනීම සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදි.

10. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් උද්ධකන්දර කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ පොහොර හැලීම සඳහා කම්කරුවන් 4 දෙනෙකුගේ සේවය දින 60 ක කාලයක් සඳහා අවශ්‍ය වී ඇති බැවින්, එම සේවය දිස්ත්‍රික් මිල ගණන් යටතේ පිටතින් ලබා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

(එක් දිනකට පොහොර හැලීමට අවශ්‍ය කම්කරු ගණන 04කි.එක් දිනකට ඇසුරුම් කල හැකි පොහොර ප්‍රමාණය 3000 kg කි.හැලීම සඳහා ඇති පොහොර ප්‍රමාණය 150000kg පොහොර හැලීම සඳහා අවශ්‍ය වන කම්කරු ප්‍රමාණය 3000 X 4 දින 60ක් සඳහා)

පිටතින් සේවයේ යොදවා ගන්නා මෙම සේවකයින් සඳහා දිස්ත්‍රික් මිල ගණන් අනුව හෝ දෛනික පදනම මත ගෙවීම කිරිම සභාව විසින් තීරණය කිරිම සුදුසු බවට ද යොජනා කරමි.

❖ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

මෙම සේවකයින් සඳහා දිස්ත්‍රික් මිල ගණන් යටතේ ගෙවීම් කිරීමට වඩා දෛනික පදනම මත ගෙවීම් කිරීම සභාවට වඩා ලාභදායී වන බැවින් ,දෛනික පදනම මත ගෙවීම කිරීම ට බඳවා ගැනීම සිදු කිරිම වඩා යෝග්‍ය බව ද ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා

උද්ධකන්දර කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ පොහොර නිෂ්පාදනය කිරීම සඳහා යම් වියදමක් දැරීමට සිදුවන බැවින් නිෂ්පාදනය කරන කොම්පෝස්ට් පොහොර කිලෝවක මිල ඉහළ දැමීමක් සිදු කිරීම වඩා යෝග්‍ය වන බවත් ප්‍රකාශ කරන ලදි.

❖ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

කසළ ප්‍රතිචක්‍රීකරණ සිදු කර පොහොර බවට පත් කර ගනු ලබන්නේ කසළ පරිසරයට මුදා හැරීම වැළැක්වීම සහ නැවත ප්‍රයෝජනයට ගැනීමෙන් සමාජයට සේවාවක් ලබාදීම අරමුණ කර ගනිමින් බවත් ආදායම් උත්පාදනයට වඩා සේවා සැපයීමේ අදහසින් පවත්වාගෙන යන බැවින් ඉදිරියේ දී පොහොර කිලෝවක මිල වෙනස් කිරීම සම්බන්ධයෙන් සලකා බැලීමක් සිදු කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදි.

➢ ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා

11. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් යෝධකණ්ඩිය ආයුර්වේද මධ්‍යස්ථානයේ වහලය සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු වටිනාකම රු.3,638,159.53 ක් වන අතර, දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රතිපාදන හිමිවන්නේ රු.මි.2.00 ක් බැවින් ඉතිරි රු.1,638,159.53 ක මුදල සභා අරමුදලින් දරා මෙම ව්‍යාපෘතිය සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.කේ.නිලුකා කුමුදුනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

12. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් දෙබරවැව පොදු ක්‍රීඩාංගනය සංගීත ප්‍රසංගය සඳහා ලබාදීම හෝ ලබා නොදීම සම්බන්ධයෙන් තීරණයක් ලබාගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා

තිස්සමහාරාම නගර සීමාවේ ක්‍රීඩා කටයුතු සඳහාත් , සංගීත සංදර්ශන හා අනෙකුත් විනෝද කටයුතු සඳහා ද පවතින්නේ ද මෙම ස්ථානය වන බැවින් ද මෙකී අරමුණු දෙකම ඉටු කර ගැනීම කළ යුතු බැවින් මෙකී යෝජනාවේ කෙටි සංශෝධනයක් සිදු කරන බවත්, ඒ අනුව සංගීත ප්‍රසංග සඳහා මෙම ක්‍රීඩාංගනය ලබාදීමේ දී දැඩි වගකීමක් පැවරෙන කොන්දේසි ඇතුළත් ගිවිසුමක් සකස් කර ලබාදීමට කටයුතු කිරීම සුදුසුවන බවට ප්‍රකාශ කරන ලදි.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හර්ෂ උදයකුමාර ජයවීර මහතා

මෙම ක්‍රීඩාංගනය ප්‍රසිද්ධ ක්‍රීඩකයින් බිහිකළ ස්ථානයක් වීමත් අනෙකුත් කුමන ස්ථානයක සංගීත ප්‍රසංග පැවැත්වුව ද මෙම ක්‍රීඩාංගනයේ පවත්වන සංගීත ප්‍රසංග සඳහා ජනතාව වැඩි වශයෙන් සහභාගී වීමට කැමැත්තක් දක්වන බවත්, ක්‍රීඩාංගනය තුළට වාහන ඇතුළත් කිරීම හේතුවෙන් හානි වන බවත් වාහන ඇතුළත් කිරීමට නොහැකි වන ලෙස දැඩි කොන්දේසි ඇතුළත් ගිවිසුමක් සහිතව සහ ක්‍රීඩකයින්ට අනතුරු සඳහා භාජනය නොවී ක්‍රීඩා කිරීමට හැකිවන අයුරින් සහ ක්‍රීඩාංගනය ආරක්ෂා වන පරිදි මෙකී කාර්යයන් දෙකට ම ලබා දීම සඳහා එකඟතාව පල කරන බවත් ප්‍රකාශ කරන ලදි.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා

සංගීත ප්‍රසංග සඳහා ක්‍රීඩාංගනය ලබා දීමෙන් එහි ක්‍රීඩාවේ නිරත වන ක්‍රීඩකයින්ට අනතුරු විය හැකිබවත්, ඒ සඳහා පන්නේගමුව ගොවි සෙවන ක්‍රීඩාංගනය වැනි ක්‍රීඩාංගන ඒ සඳහා ලබා දීමට

හැකියාවක් පවතින බැවින් ද ක්‍රීඩාංගනය ආරක්ෂා කර ගැනීමේ වගකීම සභාව සතු වන බැවින් ද සංගීත ප්‍රසංග සඳහා ලබානොදීමට සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා</u>

දෙබරවැව පොදු ක්‍රීඩාංගනය සංගීත ප්‍රසංග සඳහා ලබා දීමේ දී වාහන නතර කර තැබීමට ස්ථානයක් නොමැතිව අපහසුතාවට පත්වන බවත් ප්‍රකාශ කරන ලදි. එසේම පන්නේගමුව ගොවි සෙවන ක්‍රීඩාංගනය මෙවැනි ප්‍රසංග සඳහා යොදා ගැනීමට හැකිවන අයුරින් දැල්වැට නවීකරණය කර සකස්කර දීමට අවශ්‍ය කටයුතු සිදු කරදෙන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.තනුජා දිලානි මහත්මිය</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා විසින් දක්වන ලද අදහස සුදුසුබවත් දරුවන් ක්‍රීඩා කටයුතු සිදු කරන විට අපහසුතා ඇති වන බවත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

වර්තමානය වන විට ජනතාවගේ සතුට විනෝදය වෙනුවෙන් මෙම අවස්ථාව ජනතාවට ලබා දිය යුතු බවත් ඒ සඳහා දැඩි කොන්දේසි ඇතුළත් ගිවිසුමක් සකස් කර ඒ අනුව ක්‍රීඩාංගනය ලබාදීමට කටයුතු කිරීමට සිය එකඟතාවය පල කරන බවත් ප්‍රකාශ කරන ලදි.එසේම යකඩ ඇණ මගින් වන හානිය වළක්වා ගැනීම සඳහා නව තාක්ෂණය යොදාගනිමින් යම් ක්‍රමවේදයක් සකස් කිරීමට ඉදිරියේ දී සැලැසුම් කරන බවත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා</u>

දෙබරවැව පොදු ක්‍රීඩාංගනය ක්‍රීඩා කටයුතු වලට සහ සංගීත ප්‍රසංග වලට ලබා දීමට සියලු ම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසීම කරන ලද අතර ඒ සඳහා එකඟතාව පල නොකරන ලද ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා ද එහිදී එකඟතාව පල කළ හෙයින් තීරණ ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය නොවන බව ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හර්ෂ උදයකුමාර ජයවීර මහතා ගරු සභාපතිතුමා ඇතුළු මහ සභාව දැනුවත් කරමින් , පෙ.ව 11.05 සභා කාර්යාලයෙන් ඉවත්ව යන ලදි.)

13. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025 ,යටතේ පහත සඳහන් ව්‍යාපෘති සඳහා තෝරාගත් කොන්ත්‍රාත් සමිති වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත් සමිතිය |
|---|---|---|
| 01 | මෝලකැපුපතාන පාසල පිටුපස කාපට් එක දක්වා මාර්ගය සහ ජයමාවතේ අතුරු මාර්ගය වන ජී.කේ.කේ.සුධර්මා මහත්මියගේ නිවස අසල සිට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම. | ඩී.ඕ.02 රුහුණු ගොවි සංවිධානය, මෝලකැපුපතාන, තිස්සමහාරාම |

| | | |
|---|---|---|
| 02 | පන්නගමුව රාජපක්ෂ මාවතේ සිට ඇලකණ්ඩිය දක්වා මාර්ගයේ ඉතිරි කොටස සහ පන්නගමුව ඇලකණ්ඩිය පාරේ පතිනායක කුමාර මහතාගේ නිවස අසල සිට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම. | ප්‍රගති ගොවි සංවිධානය, පන්නගමුව, වීරවිල |
| 03 | දෙබරවැව ක්‍රීඩා පිටියේ විවේකාගාරයට ජලය සැපයීම. | පුහද ගොවි සංවිධානය, දෙබරවැව, ගොඩදෙර, තිස්සමහාරාම |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

14. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ කසල ඉවත් කිරීමේ රාජකාරි සඳහා දෛනිකව ඇති වන සේවා අවශ්‍යතා සහ කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කසළ තේරීමේ අවශ්‍යතාවය මත කම්කරුවන් සේවයේ යෙදවීම වෙනුවෙන් ජූලි මාසය සඳහා රු.538,475.00 ක මුදලක් ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

15. 2025 වර්ෂයේ පොසොන් උත්සව රාජකාරි සඳහා තිස්සමහාරාම මහා විහාරයේ රාජකාරි කටයුතු වල යෙදවීම වෙනුවෙන් රු.129,600.00 (දින 48) මුදලක් ද සහ සිතුල්පව්ව රජමහා විහාරයේ රාජකාරි කටයුතු වල යෙදවීම වෙනුවෙන් රු.67,500.00 (දින 25) මුදලක් ද කම්කරුවන් සැපයූ සේවය වෙනුවෙන් වැය වූ මුළු මුදල රු.197,100.00 ක් ද ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

16. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය තුළ රැස්වීම් පැවැත්වෙන අවස්ථාවේ දි භාවිතයට ගත හැකි ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධතියක් (මයික් සිස්ටම්) සවි කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ශයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.වයි.නුවන් චතුරංග මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

න්‍යාය පත්‍රයේ යෝජනා අංක 17,18 සහ 19 යටතේ යෝජනා ඉදිරිපත් කරන ලද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.වයි.නුවන් චතුරංග මහතා මාසික සභා රැස්වීම සඳහා සහභාගි නොවූ බැවින් යෝජනා සලකා බැලීම සිදු නොකරන ලදි.

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.තනුජා දිලානි මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

20. ප්‍රාදේශීය සභාවේ සියළු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා හැඳුනුම්පතක් ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උදානි ලියනගේ මහත්මිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

21. වීරහෙල කුඩාගම්මාන 07 ප්‍රජා ශාලාව අසලින් ඇල හරහා සකස් කොට ඇති ලෑලි පාලම අබලන් වීම නිසා ගම්වැසියන්ට ඇලෙන් එගොඩ වීම අනතුරුදායක බැවින් තාවකාලික ලෑලි වෙනුවට ඇලුමිණියම් බෝඩ් එකක් යොදා අත්වාරුවක් සහිතව පාලම සකස් කර දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

22. කුඩාගම්මාන 04 ඇල්ලගල දෙවන පෙල මාර්ගය හා සමාන්තරව දැනට පවතින කාණු පද්ධතිය හා එම කාණුවෙන් බැස යන ජලය ඇල්ලගල කුරුළුගම කුඹුරු යාය මැදින් ඇති බස්නා ඇල මේ වන විට ජලය බැස නොයන තත්වයක් පවතී.මෙම හේතුවෙන් ඉතා කුඩා වර්ෂාවකදී පවා ඇල්ලගල දෙවන පෙළ ඉඩම ජලයෙන් යටවන අතර,එම හේතුවෙන් දැනට එම නිවාස වල දියමලන් කෑම සහ ගඩොල් දියවීම දිගටම සිදුවේ.මෙම තත්වය සලකා බලා කාණු පද්ධතිය නිසියාකාරව අලුත්වැඩියා කර දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා</u>

කොන්ක්‍රීට් කර දීම අවශ්‍ය නොවන බවත් ගොයම් කැපීමේ කටයුතු අවසන් වී ඇති බැවින් JCB යන්ත්‍ර යොදා කාණුව හාරා දීම පමණක් අවශ්‍ය වන බවට ප්‍රකාශ කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ සේවා නිලධාරි ලවා එම ස්ථානය පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු සිදු කළ යුතු ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී නමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

23. තිස්සමහාරාම බල ප්‍රදේශයේ කෝන්වැලැන වසම තුල පිහිටා ඇති සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ශාලාව වෙත කෝන්වැලැන,ගෝනගමුව සහ නැදිගම්විල ප්‍රදේශවාසින් තම සෞඛ්‍ය ගැටලු විසඳා ගැනීමට මෙන් ම තම සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට මෙම ස්ථානයට නිතර පැමිණෙයි.නමුත් මේ වන විට මෙම මධ්‍යස්ථානයේ වහල ,බිම,වැසිකිලිය සුවිශේෂි කොට ගනිමින් බොහෝ අවධානම් තත්වයෙන් පැන නැගී ඇත.මෙවැනි තත්වයක් යටතේ පැමිණෙන නිලධාරින් සහ සේවාලාභීන් තම කටයුතුවල යෙදෙන බැවින් මෙම ස්ථානය පිළිබඳව සොයා බලා කඩිනමින් පිලිසකර කර දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

මෙම ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාව සතු නොවන බවත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත යොමු කිරීම සිදු කර ඉන් පිළිතුරක් නොලැබුණහොත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීම සිදු කිරීම කළ යුතු බවට ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

24. තිස්සමහාරාම බල ප්‍රදේශයේ අන්දරගස්යාය වසම තුළ පිහිටි පට්ටියවෙලයාය "අලි පාමග පාලම " මේ වන විට භාවිතයට ගැනීමට අසිරු අයුරින් කැඩී ගොස් ඇත.තහඩු යොදා සාදා ඇති මෙම පාලමෙහි තැනින් තැන විශාල වශයෙන් හානි වූ තහඩු කැබලි නිසා බර වාහන ධාවනය මෙන්ම එදිනෙදා ගමනා ගමනය ද සිදු කිරීමෙන් අපහසුතාවයක් පැන නැග ඇත.දෛනිකව මෙම පාලම හරහා ප්‍රදේශවාසීන් රැසක් මෙම පාලම හරහා තම අවශ්‍යතා සපුරා ගැනීමට යන එන බැවින් හැකි ඉක්මනින් මේ පිළිබඳව සොයා බලා කඩිනමින් විසඳුමක් ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

මෙම පාලම ද ඇතුළත් කරමින් යෝජනාවක් සකස් කර ඇති අතර එම යෝජනාව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට සහ ගරු ඇමතිතුමා වෙත යොමු කර ඇති බවට ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පි.එම්.පි.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන.මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

25. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට ඖෂධ මිලදී ගැනීමේදී මතුව ඇති ගැටළු මග හරවා ගැනීම සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්සමහාරාම ආයුර්වේද මධ්‍යස්ථානය භූමිය තුළ ඔසුසලක් ආරම්භ කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

බිං කොහොඹ මිල ඉතා වීම හේතුවෙන් ජනතාවට මිල දී ගැනීමට යම් අපහසුතාවකට පත් වීම වැලැක්වීම සඳහා මෙම ගස් වගා කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සුදුසු බවටත් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

තිස්සමහාරාම ආයුර්වේද මධ්‍යස්ථානය භූමිය තුළ ඔසු පැළ සිටුවීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් උද්ධගන්දර කොම්පෝස්ට් මධ්‍යස්ථානයෙන් බිම් කොටසක් ලබාදීමට හැකියාවක් පවතින බවත් ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩේ.දයානන්ද මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

26.තිස්සපුර ග්‍රාම නිලධාරී වසමේ පෝරුපත්තයාය ගම්මානයේ වැසි ජලය බැස යාමට ඇති කානුව වැසී ගොස් ඇති බැවින් මීටර් 300ක පමණ දුරට කානුව සකස් කර පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අතුල ප්‍රියන්ත මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

27.මහසෙන්පුර කොට්ඨාසයේ කඳුරුපොකුණ ග්‍රාම නිලධාරී වසම තුල සේවය කරන රාජ්‍ය නිලධාරීන්ට හට රාජකාරි කටයුතු කරගෙන යාම සඳහා කාර්යාල පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් නොමැති බැවින් රාජ්‍ය නිලධාරීන් හා ප්‍රදේශවාසීන් මහත් පීඩාවට පත්වන බැවින් අකුරුගොඩ පරිවේණය කොටිකාවත්තේ පිහිටි ඉඩම තුල සේවා ස්ථානයක් ඉදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කිරීම සුදුසු බවට මෙම ගරුසභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනගේ මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනගේ මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

28.තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මේ වන විට විශාල සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බැවින්, දෛනික රාජකාරි කටයුතු කරගෙන යාම සඳහා සභාවේ තාක්ෂණික නිලධාරීන් දෙදෙනාට දුෂ්කර වී ඇති බැවින් තවත් තාක්ෂණික නිලධාරීන් දෙදෙනෙකු තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අනුයුක්ත කර දෙන ලෙස පළාත් පාලන කොමසාරිස් තුමියගෙන් ඉල්ලීම් කරමින් ලිපියක් යොමුකිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

29.තිස්සමහාරාම නගරය තුල කසල බැහැර කිරීම ඉතා අවිධිමත් ආකාරයෙන් සිදුවන බැවින් එය යම් තරමකට හෝ මග හරවා ගැනීම සඳහා නගරයේ ප්‍රධාන ස්ථාන කිහිපයක කසල බඳුන් ස්ථාපනය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

රාත්‍රී කාලයේ කඩ සාප්පු වසා ගෙන යනු ලබන ව්‍යාපාරික ප්‍රජාවට ඉතිරි වන අපද්‍රව්‍ය බැහැර කිරීමට නොහැකි වීම හේතුවෙන් ඇති බව කසල බඳුන් තබන්නේ නම් ඉවතලන අපද්‍රව්‍ය වෙන් කර බැහැර කිරීමට කටයුතු කරන බවත් ඔවුන් විසින් දන්වා ඇති බවට වැඩි දුරටත් බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

30.තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් දෙමහල් ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය වසා තැබීම හේතුවෙන් දෙමහල් ගොඩනැගිල්ලේ ව්‍යාපාරික ප්‍රජාව දැඩි අපහසුතාවයට පත්ව ඇත.දෙමහල් ගොඩනැගිල්ලේ ඇති වැසිකිළිය පද්ධතිය ප්‍රතිසංස්කරණය කර නැවත විවෘත කරන ලෙසටත්, එය

පවත්වාගෙන යාමේ වගකීම ව්‍යාපාරික ප්‍රජාවට භාරදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>වෙනත් යෝජනා</u>

➢ <u>ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

**31.** දකුණු පළාතේ දිස්ත්‍රික් තුනෙහි සිසු නිපුණතා ඇගයීම වැඩසටහන සඳහා ත්‍යාග ලබා දීමට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩල CR පොත් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දිස්ත්‍රික් තුනෙහි දිස්ත්‍රික් ලේකම්වරු තිදෙනා ගරු ආණ්ඩුකාරතුමා වෙතින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව අදාල ත්‍යාග ලබා දීමට අවශ්‍ය පොත් පළාත් පාලන ආයතන වල සභා අරමුදල් යොදවා ලබා දීමට කටයුතු කරන ලෙස ආණ්ඩුකාරතුමා නියම කර ඇත.මේ සඳහා සභා අරමුදල් වැය කිරීම සඳහා පොදු අනුමැතියක්ද ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබා දී ඇති බැවින් ඒ අනුව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය සඳහා අයවැය ලේඛනයේ 605-9(6) වැය ශීර්ෂය මඟින් වෙන්කර ඇති රු.300,000.00 මුදලින් රු.230,000.00 මුදලක් වැය දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.තනුජා දිලානි මහත්මිය</u>

සිසු නිපුණතා ඇගයීම වැඩසටහන සඳහා ජලය ලබා ගැනීම සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැඟුණහොත් එම අවශ්‍යතාව සපුරාගැනීමට සහ මෙම වැඩසටහන අවසානයේ දී එකතු වන කසළ බැහැර කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙසටත් ඉල්ලීම් කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

මෙම වැඩසටහන සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට හැකි බව ප්‍රකාශ කරන ලදි.

**32.** තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක වන මහසෙන්පුර ආදාහනාගාරයේ ආදාහන සිදු කිරීම සඳහා ගෑස් මිල දී ගැනීම වෙනුවෙන් සෝමසිරි ස්ටෝර්ස් පුද්ගලික සමාගම වෙත රු.160,316.97 ක මුදලක් ගෙවීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**33.** පහත දක්වා ඇති ග්‍රාම නිලධාරි වසම් වලට අයත් මාර්ග බොරළු යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | දුර මීටර් |
|---|---|---|---|
| 01 | අංජලිගල | 6 වන පටුමග (සනත් අමරසිරි නිවස අසල සිට රත්න මල්ලි නිවස දක්වා) | 500 |
| 02 | | 4 වන පටුමග (කුලතුංග රුවන් නිවස අසල සිට කුඹුරුයාය දක්වා) | 750 |

| | | | |
|---|---|---|---|
| 03 | එකමුතුගම | රාජාධි රාජසිංහ මාවත (එම්.ඒ සෝමාවතී නිවස අසල සිට නීල් සංජීව නිවස දක්වා) | 400 |
| 04 | | ජයලත් මාවත (ඒ.පේමසිරි නිවස අසල සිට එස්.ඒ නිශාන්ත නිවස දක්වා) | 400 |
| 05 | විජිතපුර | විජිතපුර ජල ව්‍යාපෘති පාර (පස් මන් හංදිය සිට ජල ව්‍යාපෘතිය දක්වා) | 600 |
| 06 | | පාසල් මාවත 1 පටුමග (චූටි අයියාගේ නිවස අසල සිටපාසල් මාවත එස්.ඒ දුලාෂි නිවස දක්වා) | 600 |
| 07 | සඳුන්ගම | සිංහ මාවත (රුබර් කඩේ අසල සිට මහ ඇල දක්වා) | 500 |
| 08 | | ගල්පග මාවත (කාපට් පාර අසල සිට ඩී.එම් කරුණාවතී නිවස දක්වා) | 700 |
| 09 | මාගම | මාගම පන්සල ඉදිරිපිට සූරිය ඉඩමට යන මාවත,මාගම ඇළ කණ්ඩිය යාය ප්‍රධාන පාර | |
| 10 | අන්දරගස්යාය | ගොඩාන වළං කඩය ඉදිරියේ ඇති පාර,පාමග පාලම අසළින් පට්ටියවෙලයාය ක්‍රීඩාපිටියට යන පාර | |
| 11 | ගැමුණුපුර | නන්දසේන මහතාගේ නිවස අසල සිට ගයනි සේල් එක කිරිදිඹය පාර දක්වා | 350 |
| 12 | | සමූපකාරය ඉදිරිපිට සිට කිරිදිඹය පාර දක්වා | 250 |
| 13 | පොල්ගහවැලැන | පියසිරි සර්ගේ නිවස අසල සිට මාර්ගය අවසන් වන තෙක් | 350 |
| 14 | | සුගත් මහතාගේ නිවස අසල සිට පන්වල හංදිය මෝල අසල දක්වා | 500 |
| 15 | පන්නගමුව | ඉන්දික මහතාගේ නිවස අසල සිට ලක්ෂිත මහතාගේ නිවස දක්වා | |
| 16 | | පන්සල අසල සිට කුසල් රෙස්ට දක්වා | |
| 17 | ඇල්ලගල | හල්මිල්ල වංගුව සිට ගහ දක්වා | |
| 18 | | මෙන්සින් මාවත ගොවිපල දක්වා | |
| 19 | පූල්පල්ලම | මහසෝන් ගම්මානයට ප්‍රවේශ වන මාර්ගය | 800 |
| 20 | | රන්මිනිතැන්න කම්හල පාර | 150 |
| 21 | රණකෙලිය වසම | කොරගහපොත ආරන්යට යන මාර්ගය | |
| 22 | | යෝධකණ්ඩිය පාසලේ ක්‍රීඩාපිටිය අසලින් ඇති මාර්ගය | |
| 23 | යෝදකණ්ඩිය | වැලිපොතේවෙල බුදුමැදුර අසල සිට දෙවැනි ඇල දක්වා | |
| 24 | | වැලිපොතේවෙල පාලමේ සිටමායිම කුඹුර දක්වා | |
| 25 | | යෝධකණ්ඩිය පොල් බිදිවල සමගිමාවත | |
| 26 | | යෝධකණ්ඩිය පිදුරු සෙන්ටර් එක අසල ශ්‍රියා මාවත | |
| 27 | | උද්දකන්දර තිරාවල සිට දියවර ගම්මානය දක්වා දිවෙන මාර්ගය | |
| 28 | | උද්දකන්දර සම්පත ගම්මානයට පිවිසෙන ස්ථානයේ ඇති වම් පස මාර්ගය | |

| | | | |
|---|---|---|---|
| 29 | කාවන්තිස්සපුර | H.N.T හෝටලය අසලින් ඇති මාර්ගයේ වමට හා දකුණට ඇති මාර්ග දෙක | |
| 30 | හල්මිල්ලාව | කොරනෙල් ඉඩම පාර,දෙවෙනි ඇළ පාර | |
| 31 | කෝන්වැලැන වසම | ජයසූරිය බස්නාව පාර,තැපැල් පෙට්ටිය පාර | |

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

මෙහි දක්වා ඇති රාජාධි රාජසිංහ මාවත (එම්.ජ් සෝමාවති නිවස අසල සිට නිල් සංජීව නිවස දක්වා) ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය මගින් ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කර ඇති බැවින් එය මෙයින් ඉවත් කිරීමටත් , රත්මිනිතැන්න කම්හල පාර රත්මිණිතැන්න අතරු මාර්ගය ලෙසත් සංශෝධනය විය යුතු බවට ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

34.දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025 යටතේ පහත සඳහන් ව්‍යාපෘති සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති කොන්ත්‍රාත් ආයතන වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා අනුමැතියට ගරු මහ සභාවට ඉදිරිපත් කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත් ආයතනය |
|---|---|---|
| 01 | තිස්ස පූජා භූමියේ සංචාරකයින් සඳහා විවේක ගන්නා ස්ථානයක් සකස් කිරීම | සිතිජ නිමසර කන්ස්ට්‍රක්ෂන්, නව නගරය, වීරවිල |
| 02 | කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ ගිනිගත් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | සිතිජ නිමසර කන්ස්ට්‍රක්ෂන්, නව නගරය, වීරවිල |
| 03 | තිස්ස නගරයේ කාණු පද්ධතිය දීර්ඝ කිරීම.(වැසිජලය බැස්සවීම සහ ගංවතුර පාලනය කිරීම) | ලේබා කන්ස්ට්‍රක්ෂන්, හැළඹගස්වල, තිස්සමහාරාම |
| 04 | යෝධකණ්ඩිය ආයුර්වේද මධ්‍යස්ථානයේ වහලය සකස්කිරීම. | ලේබා කන්ස්ට්‍රක්ෂන්, හැළඹගස්වල , තිස්සමහාරාම |
| 05 | ගණේයාය පෙර පාසලේ වහලය සහ සිවිලිම සකස්කිරීම. | නෙළුම් ගොවි සංවිධානය, එකමුතුගම,මුතියම්මාගම,තිස්සමහාරාම. |
| 06 | උද්ධගන්දර පෙර පාසලේ සිවිලිම සකස්කිරීම සහ දෙවන ශාලාවෙහි ජනෙල් කවුළු සකස කිරීම. | බණ්ඩාරවත්ත බෙදුම්වැල ගොවි සංවිධානය, බණ්ඩාරවත්ත, රණකෙළිය,තිස්සමහරාම. |
| 07 | මහසෙන්පුර ආදාහනාගාරය සඳහා ජලය සැපයීම. | දෙබරවැව, වලදොර පුබුදු ගොවි සංවිධානය,රබර්වත්ත,තිස්සමහාරාම |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

35.ප්‍රාදේශීය සභා තාර මාර්ග මාර්ග නඩත්තු කිරීම සඳහා ගල්තාර මිල දී ගැනීමටත් (ප්‍රිමිස්) ,අදාල තාර (දියර) මිලදී ගැනීම හා අදාළ ගල් වැලි මිලදී ගැනීම සුදුසු බවට,නගර පදික වේදිකා ක්‍රමවත්

කිරීම සඳහා කාණු ආවරණ සැකසීම,ආරක්ෂිත බැම් සැකසීම සහ වීදි ලාම්පු ක්‍රමවත් කිරීම සුදුසු බවටත් ,පහත දක්වන ලද ට්‍රැක්ටර් , අලුත්වැඩියා කල හැකි ප්‍රමාණය අලුත්වැඩියා කිරීම හා අනෙකුත් වාහන වෙන්දේසි කිරීම (ට්‍රැක්ටර් ගලවා පරීක්ෂා කිරීමෙන් පසුව) සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- මැසි ෆර්ගියුසන් - 240 - 49-4085
- වැගේ ට්‍රැක්ටර් - 45 – JA -6168
- මැසි ෆර්ගියුසන් -240- RD -6554
- ජෝන් ඩියර් ට්‍රැක්ටර් - RA -3420

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

වැගේ ට්‍රැක්ටර් - 45 – JA -6168, මැසි ෆර්ගියුසන් -240- RD -6554 සහ ජෝන් ඩියර් ට්‍රැක්ටර් - RA -3420 ට්‍රැක්ටර් අලුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමටත් මැසි ෆර්ගියුසන් - 240 - 49-4085 ට්‍රැක්ටර් රථය වෙන්දේසි කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

36.පළාත් පාලන සතිය වෙනුවෙන් සිදු කරන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට වූ යෝජනාව අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

| දිනය | වැඩසටහන | ඇස්තමේන්තුගත වියදම |
|---|---|---|
| 2025.09.15 | <u>ජංගම සේවා දිනය</u><br>▯ ස්ථානය-දෙබරවැව පොල<br>▯ කෝරාගත් බල ප්‍රදේශයේ කසල එක්රුස් කිරීම,කාණු පද්ධතිය සුද්ද කිරීම,අනවසර කුණු කසල ඉවත් කිරීම ආදී සේවාවන් සිදු කිරීම.ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,ග්‍රාම නිලධාරි,ආර්ථික සංවර්ධන නිලධාරි සම්බන්ධ කර ගැනීම | 75,000.00 |
| 2025.09.16 | <u>පරිසර සහ රුක් රෝපණ දිනය</u><br>▯ රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.තිස්ස පන්සල පිටුපස ඇල රක්ෂිතයේ මී පැල සිටුවීම.<br>▯ඉලෙක්ට්‍රොනික උපාංග එකතු කිරීමේ වැඩසටහන්(ට්‍රැක්ටර් රථයක් එදිනට නතර කිරීම)<br>▯ පාසල් වල පරිසර බට කණ්ඩායම් හරහා ශ්‍රමදාන සිදු කිරීම<br>▯කෙටි චිත්‍රපටයක් පෙන්වීම | 150,000.00 |
| 2025.09.17 | <u>සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය</u><br>▯ගර්භනී මවුවරුන්ගේ දැනුවත් කිරීම(දේශනයක් සංගීත චිකිත්සක වැඩසටහනක්)<br>▯සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරික්ෂක අනුර මහතා සුරංග මහතා සම්බන්ද කර ගැනීම<br>▯ජලභිතිකා එන්නත්කරණ වැඩසටහන<br>▯ආයුර්වේද සායනයක් පැවැත්වීම(වෛද්‍ය කුමාරි මිය) | 270,000.00 |

| | | |
|---|---|---|
| 2025.09.18 | <u>ආදායම් ප්‍රවර්ධන දිනය</u><br>☐ වරිපනම් ,කඩ කුලී,වෙළඳ බදු අය කිරීම තෝරාගත් ප්‍රදේශයක සභාවෙන් සිදුවිය යුතු සේවාවන් ඊට පෙර සිදු කර එදිනවඅය කිරීම් කටයුතු සිදු කිරීම,ප්‍රචාරණ කටයුතු සිදු කල යුතුය. | 50,000.00 |
| 2025.09.19 | <u>සාහිත්‍ය,අධ්‍යාපනය සහ පුස්තකාල ප්‍රවර්ධන දිනය</u><br>☐ මාගම,අන්දරගස්යාය,ගගේයාය,ඉක්කපල්ලම,කිරින්දගම පාසල් මූලික කරගෙන දේශකයෙකු කැදවා සාහිත්‍ය රසවින්දනාත්මක වැඩසටහනක් පැවැත්වීම<br>☐ පුස්තකාලයේ පාඨක සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීම | 60,000.00 |
| 2025.09.20 | <u>මහජන උපයෝගිතා දිනය</u><br>මහසෙන්පුර ආදාහනාගාරය සුද්ද පවිත්‍ර කිරීම,තිත්ත ගැම<br>☐ සුසාන භූමි 02ක ශ්‍රමදානය සදහා ජේ.සී.බී යන්ත්‍රයක් ලබා දීම.(සෙනවිරාජගම,ඇල්ලගල කු.ග 04)<br>☐ වෙලද සංගමය සමග එක්ව තිස්සබස් නැවතුම්පල අවට මල්පැල සිටුවා නගර අලංකරන කටයුතු සිදු කිරීම.<br>☐ අනවසර නාමපුවරු ඉවත් කිරීම | 40,000.00 |
| 2025.09.21 | <u>ක්‍රීඩා දිනය,සහතික පත්‍ර ප්‍රධානය හා සමාජ්නිය</u><br>☐ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,පොලිසිය,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයන්හි නිලධාරින් සම්බන්ධ කරගෙන ක්‍රීඩා උත්සවයක් පැවැත්වීම.<br>☐ ත්‍යාග පිරිනැමීම,සංග්‍රහ කටයුතු සිදු කිරීම | 180,000.00 |

= 825000.00

සමස්ථ වැඩසටහනෙහි ශබ්ද විකාශන සදහා ගෙවීම් (SOUNDS) = 75000.00

ඇස්තමේන්තුගත සමස්ථ වියදම (රු) = <u>900000.00</u>

**පළාත් පාලන සතිය වෙනුවෙන් අවශ්‍ය වියදම් දැරීම සදහා වන මුදල් ආවරණය කරගනු ලබන වැය විෂයයන්**

| වැය විෂය | වෙන් කර ඇති මුදල | 2025.07.31 දිනට ඉතිරි ශේෂය | පළාත් පාලන සතිය වෙනුවෙන් ලබා ගන්නා මුදල (රු) |
|---|---|---|---|
| 605-9(1) පළාත් පාලන ක්‍රීඩා උළෙල | 100,000.00 | 100000.00 | 100,000.00 |
| 605-9(2) ළමා හිංසනය වැලැක්වීම, කාන්තා අභිවෘද්ධි වැඩසටහන් | 200,000.00 | 200000.00 | 100,000.00 |
| 605-9(5) ආපදා කළමනාකරණය | 500,000.00 | 497,730.00 | 200,000.00 |
| 205-6 ආහාර හා සනීපාරක්ෂාව | 250,000.00 | 199,803.61 | 100,000.00 |
| 205-7 පරිසර වැඩසටහන් සඳහා | 400,000.00 | 172,006.66 | 50,000.00 |
| 205-9(3) ආයුර්වේද සායන, ළමා හා මාතෘ සායන | 150,000.00 | 150,000.00 | 150,000.00 |
| 205-9(4)(ඩෙංගු මර්ධන හා බෝවන රෝග මර්ධන වැඩසටහන්) | 300,000.00 | 300,000.00 | 200,000.00 |

<u>900,000.00</u>

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

37.දකුණු පළාත් සංවර්ධන සැලැස්ම -2025 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ පළාත් පාලන සේවා අංශය යටතේ ක්ලීන් ශ්‍රී ලංකා විශේෂ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇති රු.100,000.00 ප්‍රදාන පහත සඳහන් පරිදි ඩෙංගු පාලනය හා ස්වාභාවික ආපදා වලින් ජනතාව මුදවා ගැනීමේ අරමුණින් යෙදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනාව කරමි.

| වැඩසටහන් විස්තරය | ඇස්තමේන්තු මුදල රු. |
|---|---|
| ප්‍රාදේශීය මාර්ග වල අනතුරුදායක ගස් හා අතු ඉති ඉවත් කිරීම සඳහා සේවා සැපයීමේ ගාස්තු | 50,000.00 |
| තණකොළ කපන යන්ත්‍ර හා වෙනත් යන්ත්‍ර සඳහා ඉන්ධන | 10,000.00 |
| ගාබේජ් බෑග් හා අත් ග්ලවුස් සඳහා | 6,300.00 |
| තිස්ස වැව,යෝධවැව,තිස්ස පන්සල පිටුපස ඇල ආසන්නයේ පිරිසිදු කිරීම | 6,300.00 |
| වෙනත් වියදම | 27,400.00 |
| මුළු වියදම | 100,000.00 |

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

38.පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක HACLG/DEV/02/HDALTR හා 2025.08.18 දිනැති ලිපිය අනුව දකුණු පළාත තුළ සුනඛ ගහනය පාලනය කර ගැනීම හා ජලභීතිකා රෝගය පාලනය කිරීම සඳහා සුනඛ වන්ධ්‍යාකරණ කිරීමේ වැඩසටහන පැවැත්වීම වෙනුවෙන් රු.100,000.00 ක ප්‍රතිපාදන ආණ්ඩුකාර වැය ශීර්ෂය යටතේ ලබා දී ඇත.ඒ අනුව තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සුනඛ වන්ධ්‍යාකරණ කිරීමේ කටයුතු කිරීම සඳහා එම ප්‍රතිපාදන 205 -7 වැය ශීර්ෂය යටතේ යොදා ගනිමින් ඉදිරි කටයුතු සිදුකිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

39.දකුණු පළාත් පාලන සතිය - 2025 ,2025.09.15 දින සිට 2025.09.21 දක්වා ක්‍රියාත්මක වීමට නියමිත බැවින් ඒ සඳහා කැනපි අවශ්‍ය වී ඇත.ගබඩාවේ පවතින කැනපි භාවිතයට ගත නොහැකි ලෙස කැඩී ඇති බැවින් ඒ සඳහා අලුතින් කැනපි ලබාගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

40. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රතිපාදන මත, තිස්සමහාරාම බස්නැවතුම්පල නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිරිවැඩ කටයුතු සිදුකිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

41.ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් වන එම්.එල්.එම්.හනීෆා මහතා, කේ.රත්න මහතා , එල්.වයි.නුවන් චතුරංග මහතා සහ එල්.ජ්.සුනිල් පියංකර මහතා 20205.08.21 වන දින පැවැත්වෙන අගෝස්තු මස මාසික මහ සභාව වෙත සහභාගී වීමට නොහැකි බවට දැනුම් දී ඇති බවත් එය මෙම ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම.

2025.08.11 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව, 2025.08.07 වන දින පවත්වන ලද කාර්මික සේවා කාරක සභා වාර්තාව ,2025.08.06 දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සහ 2025.08.06 වන ලද පරිසර පොදු පහසුකම් කාරක සභා වාර්තාවන් හි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා,වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම.

I. <u>2025 ජූලි මස ඒකාබද්ධ ලැබීම් හා ඒකාබද්ධ වියදම් සාරාංශය</u>

2025 ජූලි මස ඉලක්ක ගත මාසික ආදායම රු.22,816,777.21 වන අතර සත්‍ය ආදායම රු.26,058,610.43 ද, ජූලි මස ඉලක්ක ගත මාසික වියදම රු.19,226,113.41 වන අතර සත්‍ය වියදම රු.16,954,768.52 ද වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

II. <u>2025 ජූලි මස හිඟ ආදායම් වාර්තාව</u>

2025 ජූලි මාසය අදාළ, ආදායම් අය කර ගැනිම සහ හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය අනුව සමස්ත හිඟ මුදල රු.7,812,542.20 වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

III. <u>2025 ජූලි 01 දින සිට ජූලි 31 දක්වා රු.100,000.00 ඉක්ම වූ ගෙවීම් විස්තරය ඇතුළත් වාර්තාව</u>

| දිනය | වවුචර අංකය | වවුචර විස්තරය | ගෙවන ලද ආයතනය/කාටද යන වග | මුදල රු. |
|---|---|---|---|---|
| 2025-07-07 | 19 | සභා පෙර පාසල් 06 සඳහා තීන්ත මිළට ගැනිම. | දිල්ශාන් ට්‍රේඩ් සෙන්ටර් | 397,798.06 |
| 2025-07-08 | 45 | 2025 ජුනි මස දෛනික කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම. | ලේකම් - තී.ප්‍රා.ස. | 249,361.86 |
| | 46 | කසළ රාජකාරී කටයුතු සඳහා සේවය ලබාගත් තාවකාලික කම්කරු වැටුප් ගෙවීම. 2025 ජුනි | ලේකම් - තී.ප්‍රා.ස. | 469,800.00 |
| | 47 | පොසොන් උත්සව රාජකාරී කටයුතු සඳහා සේවය ලබාගත් තාවකාලික | ලේකම් - තී.ප්‍රා.ස. | 267,300.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | කම්කරු වැටුප් ගෙවීම. 2025 ජූනි | | |
| | 49 | මාර්ග ඉන්ජිනේරුවරු සහාය කිරීමට පිටතින් සේවය ලබාගත් පුද්ගල 02 දෙනාගේ ගාස්තු ගෙවීම. | ලේකම් - ති.ප්‍රා.ස. | 106,000.00 |
| | 53 | 2026 ජූනි මස අතිකාල වියදම් දීමනා ගෙවීම. | ලේකම් - ති.ප්‍රා.ස. | 636,726.00 |
| | 55 | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ඉමේෂා ෆිලිං ස්ටේෂන් පුද්ගලික සමාගම | 316,508.50 |
| 2025-07-18 | 56 | උද්දපාලෙදර කසළ බැහැර කරන ඉඩම බෙදුම්කරන පොදු භූමිය හා පෞද්ගලිකත්ව ඉඩම් මැනුම් කටයුතු සිදුකිරීම ගාස්තු ගෙවීම. | සර්වේයර් ජනරාල් පලාත් සර්වේයර් ජනරාල් කාර්යාලය | 134,011.68 |
| | 58 | ති.ප්‍රා.සභාවට පත් වූ ගරු සභික මන්ත්‍රී මන්ත්‍රීන් සඳහා 2025 ජූනි මස සභික දීමනා ගෙවීම. | ලේකම් - ති.ප්‍රා.ස. | 345,000.00 |
| 2025-07-22 | 67 | 2025 - ජූලි මස ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම. | ලේකම් - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව කාර්ය මණ්ඩලය | 6,095,538.94 |
| 2025.07.29 | 77 | මහසෙන්පුර සෞඛ්‍යාගාරය සඳහා 37.5 kg ගෑස් සිලින්ඩර් 08 ක් මිලදී ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | ලෝමිසිරි ස්ටෝර්ස් පුද්ගලික සමාගම | 142,503.97 |
| | 78 | කාර්යාලයට අවශ්‍ය කුෂන් පුටු 12 ක් හා පුස්තකාලයට නැරඹුම පුටු 01 ක් මිලදී ගැනීම. | නිව් සමිකල ෆර්නිචර්ස් | 117,900.00 |
| | 79 | RD - 8051 මග ට්‍රැක්ටරයේ එංජිම අළුත්වැඩියා කිරීම. | බී.ජී. ප්‍රදීප් | 112,300.00 |
| | 81 | සභා කාර්යාලයට ඇඟිලි සළකුණු යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | ET Lab Manufacturing PVT LTD | 100,800.00 |
| | 83 | 56-1099 ට්‍රැක්ටරය සඳහා 215*75*5 ප්‍රමාණයේ පිටුපස ටයර් 04 ක් මිලදී ගැනීම. | ටයර් ලින්ක් පුද්ගලික සමාගම | 129,536.00 |
| | 84 | RD - 8051 මග ට්‍රැක්ටරයේ එංජිම අළුත්වැඩියා කිරීම සඳහා අමතර කොටස් මිලදී ගැනීම. | කුසුම් මෝටර් ස්ටෝර්ස් | 108,430.00 |
| | 96 | LL - 6981 ටිපර් රථය සඳහා 1000*20 ටයර් 02 , ටියුබ් 02 , ෆ්ලැප්ස් 02 මිලදී ගැනීම. | ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව | 172,516.00 |
| | 109 | 2025 ජූලි මස සභික දීමනා ගෙවීම. | 2025 ගරු සභික මණ්ඩලය | 345,000.00 |
| | 110 | 2025 ජූලි මස සභික ඉන්ධන දීමනා ගෙවීම. | 2025 ගරු සභික මණ්ඩලය | 108,000.00 |
| | 111 | LL - 7379 කලි ට්‍රැක්ටරය සඳහා නව | ඩබ්.ජී.ඩී. චතුරංග | 694,200.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | ගිලි පොම්පයක් සපයා සවිකිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | | |
| | 112 | JS - 9860 බැකෝ යන්ත්‍ර යේ අළුත්වැඩියා කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම | JM Industries and Suppliers | 458,000.00 |
| 2025-07.31 | 126 | LM - 5616 කම්පැක්ටර් රථයේ 825*16 ටයර් , ටියුබ් , රිම්ටේප් 02 මිලට ගැනීම. | ටයර් ලින්ක් පුද්ගලික සමාගම | 127,664.00 |
| | 133 | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන මිලට ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ඉරේෂා ෆිලිං ස්ටේෂන් පුද්ගලික සමාගම | 656,516.00 |
| | 135 | අපද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානයේ ජල සැපයුම සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා නල ලිඳෙහි පොම්පය ගලවා නැවත සවිකිරීම වෙනුවෙන් බිල්පත් පියවීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 150,096.00 |

2025 ජූලි 01 දින සිට ජූලි 31 දක්වා රු.100,000.00 ඉක්ම වූ, ඉහතින් දක්වා ඇති ගෙවීම විස්තරය ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

## IV. 2025 ජූලි 01 සිට 2025 ජූලි 31 දින දක්වා සැලසුම් කමිටු අනුමැතිය ලැබී ඇති ගොනු ඇතුළත් වාර්තාව

| අනු අංකය | ලියාපදිංචි අංකය | නම හා ලිපිනය | අනුමැතිය | කමිටු දිනය |
|---|---|---|---|---|
| 01 | ත්‍රිප්‍රාස/19/SD/2024/198 | කේ.ඩී. ඉන්ද්‍රානි, බංගලාවත්ත, 3කණුව,කිරින්ද පාර,තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය. | 2025.07.01 |
| 02 | TPS/19/SD/2025/93 | ගුණසේන වීරරත්න, අංක 408, ජුල්පල්ලම , තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.07.01 |
| 03 | TPS/19/SD/2025/97 | පී.එල්.ගීතා, අංක 367/2, පන්සල ඉක්කපල්ලම ,ගෝනගමුව. | අනුබෙදුම අනුමත විය | 2025.07.01 |
| 04 | TPS/19/SD/2025/98 | උදිත පණ්ඩුක වික්‍රමගේ, 367/2, පන්සල ඉක්කපල්ලම ,ගෝනගමුව. | අනුබෙදුම අනුමත විය | 2025.07.01 |
| 05 | TPS/19/SD/2025/99 | සුනිල් බස්නායක,අංක 359,දකුණු රණකෙලිය,යෝධකණ්ඩිය,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.07.01 |
| 06 | TPS/19/BA/2025/104 | කේ.එල්.පී. සුරමයා, අංක 264/2,ඩී ඩී ගුණවර්ධන මාවත, දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.07.16 |
| 07 | TPS/19/BA/2025/95 | කේ.එල්.පී. සුරමයා, අංක 264/2,ඩී ඩී ගුණවර්ධන මාවත, දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.07.16 |
| 08 | TPS/19/BA/2025/100 | හසිත රන්දුනු වීරසිංහ,අංක 106,මහසෙන්පුර,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.07.16 පවතින බිමක් සේ සලකා |
| 09 | TPS/19/SD/2025/107 | කේ.ඩී. ඉන්ද්‍රානි, බංගලාවත්ත, 3කණුව,කිරින්ද පාර,තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.07.16 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | TPS/19/SD/2025/108 | එච්.ජී.සුගතදාස, අඹිලිකාරයාය, මාගම, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.16 |
| 11 | TPS/19/SD/2025/109 | එච්.ජී.හර්ෂිකා මධුවන්ති, අඹිලිකාරයාය, මාගම, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.16 |
| 12 | TPS/19/SD/2025/110 | එච්.ජී.හර්ෂිකා මධුවන්ති, අඹිලිකාරයාය, මාගම, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.16 |
| 13 | TPS/19/SD/2025/76 | පී.ජී.චන්ද්‍රපාල, අංක 856,මැදැවැලැන, දෙබරවැව,තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.25 |
| 14 | TPS/19/SD/2025/77 | ජී.ජී.ඉසුරු ප්‍රියංකර, අංක 856, මැදැවැලැන, දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.25 |
| 15 | TPS/19/SD/2025/105 | වඩුගේ චන්ද්‍රදාස,අංක 275, කු.ග.08, රන්මිණිතැන්න, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.25 |
| 16 | TPS/19/SD/2025/122 | සුරංග කාමල් නානායක්කාර,අංක 236/1, රන්තරුමාවත, යෝධකණ්ඩිය, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.25 |
| 17 | TPS/19/SD/2025/112 | සුරංග කාමල් නානායක්කාර,අංක 236/1, රන්තරුමාවත, යෝධකණ්ඩිය, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.25 |
| 18 | TPS/19/SD/2025/111 | අයි.ප්‍රියදර්ශනී දිසානායක ,අංක 485/3,11 වන පටුමග, දෙබරවැව , තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.25 |
| 19 | TPS/19/SD/2025/114 | එන්.ඩී. ශාම් කුමාර,අංක 740/1,සේනාපුර,තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.25 |
| 20 | TPS/19/SD/2025/113 | ඩබ්.එච්.වසන්ත, 48 ඩී, කොහොඹගහපැලැස්ස, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.25 |
| 21 | TPS/19/SD/2025/116 | කලුතොට පියතිලක,හැලඹගස්වල,තිස්සමහාරාම. | අනුබෙදුම් අනුමත විය | 2025.07.01 |
| 22 | TPS/19/SD/2025/119 | කේ.එල්.ධර්මසේන,අංක 217/7,වැලිආරගොඩ,තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.07.01 |
| 23 | TPS/19/BA/2025/44 | එච්.ආර්.ජයන්ත,ගිරිපදවත්ත,හැලඹගස්වල,සඳිලියාය,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.07.01 |
| 24 | TPS/19/BA/2025/48 | උදිත පණ්ඩුක වික්‍රමගේ, 367/2, පන්සල ඉක්කපල්ලම ,ගෝනගමුව | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.07.01 |
| 25 | TPS/19/BA/2025/50 | එච්.ඒ.ඩබ්.එම්.අභයසිරි, අංක 427,ගහසිරිපුර, දෙබරවැව,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.07.01 |
| 26 | TPS/19/BA/2025/49 | ලක්සිරිනි රුවනිකා විරසිංහ,බංගලාවත්ත,වැලාපොතේවෙල, යෝධකණ්ඩිය. | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.07.01 |
| 27 | TPS/19/BA/2025/51 | ඩබ්.පී.කාමල් ප්‍රියන්ත, සේනාපුර, දෙබරවැව, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.07.16 |
| 28 | TPS/19/BA/2025/53 | එච්.එච්.ඒ.නිලූකා හෙට්ටිආරච්චි, බෝගහපැලැස්ස, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.07.16 |
| 29 | TPS/19/BA/2025/52 | ජී.ජී.කරුණාරත්න, අංක 181/7,අලුත්ගොඩ, තිස්සමහාරාම. | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.07.16 |

| | | | | |
|---|---|---|---|---|
| 30 | TPS/19/BA/2025/54 | ඩබ්.ටී.පී.සිල්වා,කිරින්ද,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.07.16 |
| 31 | තිප්‍රාස/19/සං/අ/2024/104 | ඩබ්.එච්.ගාමිණී,අංක 574/1,ගහසිරිපුර,දෙබරවැව,තිස්සමහාරාම. | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.07.16 |
| 32 | TPS/19/BA/2025/41 | ඒ.එච්.කපුන් දනුරුද්ද සිල්වා,අංක 264/5,ගුණවර්ධන මාවත,දෙබරවැව,තිස්මහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.07.25 |
| 33 | TPS/19/BA/2025/57 | එස්.ටී.පී.හසන්ත,අංක113/11, වරාකනත්ත, කච්චේරියගම,තිස්සමහාරම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.07.25 |
| 34 | TPS/19/BA/2025/58 | දිලිප් කුමාර ලියනපතිරණ,අංක 446, ගණේයාය, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.07.25 |
| 35 | TPS/19/BA/2025/60 | එම්.දයාවතී,අංක57,පුංචි අකුරුගොඩ,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.07.25 |
| 36 | TPS/19/BA/2025/09<br>TPS/19/COC/2025/21 | දිනේෂ් එරික් සිල්වා ,දෙවෙනි ඇල, මාගම තිස්සමහාරාම | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය | 2025.07.16 |
| 37 | TPS/19/BA/2025/52<br>TPS/19/COC/2025/20 | ඩබ්.පී.නාමල් ප්‍රියන්ත, සේනපුර, දෙබරවැව, තිස්සමහාරාම | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය | 2025.07.25 |
| 38 | තිප්‍රාස/19/සං/අ/2020/100<br>TPS/19/COC/2025/22 | ජී.පී.මුතුමාල,අංක 110,මහවිදිය,තිස්සමහාරාම | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය | 2025.07.25 |
| 39 | TPS/19/BA/2025/02<br>TPS/19/COC/2025/23 | ආර්.කේ.අමිල ප්‍රසංග, අංක38, වැල්ලවායපාර,වීරවිල | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය | 2025.07.25 |
| 40 | තිප්‍රාස/19/සං/අ/2024/25 | ඩී.පී.චාමර මදුෂාන්,අංක399, ගහසිරිගම,ගෝණගමුව,තිස්සමහාරාම | කාලය දීර්ඝ කිරීම අනුමත විය | 2025.07.25 |

2025.07.01 සිට 2025.07.31 දින දක්වා සැලසුම් කමිටු අනුමැතිය ලැබී ඇති ගොනු ඇතුළත් ඉහතින් දක්වා ඇති වාර්තාව ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදී.

(ඌ) වෙනත් කරුණු.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා</u>

සභා කටයුතු ආරම්භ කිරීමට පෙර ආගම සිහිකිරීමටත්,මිය ගිය රණවිරුවන් සිහිකිරීමත් සිදු කිරීම න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවටත් ප්‍රකාශ කරන ලදී.එසේම රණකෙළිය කෙටි මාර්ගයේ බෝක්කුව කැඩීගොස් ඇති බවත් එය පිලිසකර කරදෙන මෙන් සහ අපගේ වැරදි අඩුපාඩු හදාගෙන පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියළුදෙනාම එක්ව වැඩ කටයුතු කරගෙන සිදු කළ යුතු බවත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමය තමන් කැමති බවත් ,යම් වැරදීමක් සිදු වුවහොත් එය සියලුදෙනාටම අධිභාර වීමක් සිදු විය හැකි බැවින්,මිල දී ගැනීම් සිදු කිරීමේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළම අදාල කාර්යයන් සිදු කිරීම සුදුසු බවටත් ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණී මහත්මිය</u>

බොහෝ මන්ත්‍රීවරුන් නවක මන්ත්‍රීවරුන් වන බැවින් අදහස් දැක්වීමේ දී යම් යම් අඩුපාඩු සිදු විය හැකි බවත් ඒවා නිවරදි කර ගනිමින් ඉදිරියට කටයුතු කරගෙන යාම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

- <u>අදහස් දැක්වීම -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.තනුජා දිලානි මහත්මිය මහත්මිය</u>

පෙර සඳහන් කරන ලද සේවයෙන් ඉවත් කරන ලද සේවකයන් තිදෙනාගේ තොරතුරු තමන් ලබාගත් බවත් ඒ අනුව එස්.තක්ෂිලා සහ එම්. ශ්‍යාමා යන සේවකයින් දෙදෙනා මුල් පත්වීම් දිනය 2015/06/03 වන බවත් 2022 වර්ෂය දක්වා දෛනිකව සේවයේ යෙදී සිට දරු ප්‍රසූතිය සඳහා නිවාඩු ලබාගත් පසු නැවත සේවයට බඳවාගෙන නොමැති බවත් අනෙක් තැනැත්තා ඩී.එල්.සුභාෂිණි වන අතර ඇය සභාවේ වසර 17 ක් සේවය කර දරුවාගේ අසනීපය නිසා නිතර නිතර ප්‍රතිකාර සඳහා නිවාඩු ලබාගැනීම හේතුවෙන් රැකියාවෙන් ඉවත් කර ඇති බවත් මෙම සේවකයින් තිදෙනා කිසිදු විනය විරෝධි කටයුත්තක් සිදු කර නොමැති බවත් මේ පිළිබඳ සලකා බලා යම් සාධාරණයක් ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා</u>

රණකෙළිය බෝක්කුව සකස් කිරීමට තාක්ෂණ සේවා නිලධාරීන් විසින් ඇස්තමේන්තු සකස් කරමින් පවතින බවත් එම කාර්යය ඉතා ඉක්මනින් ඉටු කිරීමට හැකි බවත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කටයුතු කර නොමැති බවත්,රණවිරුවන් සිහි කිරීම සහ ආගම සිහිකිරීම වඩා යහපත් කාර්යයන් වන නමුත් මෙය ප්‍රාදේශීය සභාවක් වන බැවින් එහි න්‍යාය පත්‍රය සකස් කිරීම සිදු කරන්නේ සභා රීති වලට අනුකූලව බවත් ප්‍රකාශ කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

විවිධ අදහස් හා මතවාද පැවතිය හැකි බවත් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එක්ව කටයුතු කළ යුතු බවත් න්‍යාය පත්‍රය සකස් කිරීම සිදු කරන්නේ සභා රීති වලට අනුකූලව බවත්,සේවයෙන් ඉවත් කරන ලද සේවකයින් තිදෙනා විනය විරෝධි කටයුත්තක් සිදු කළ බවට අදහස් නොදැක්වූ බවත්, විනය විරෝධි කටයුතු නිසා එම කාලයේ සේවකයින් ඉවත් කිරීම සිදු කර තිබූ බවටත් ප්‍රකාශ කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා</u>

පන්නේගමුව පොළ සම්බන්ධයෙන් සැලැස්මක් යෙදවීම සුදුසු බවට වාචිකව දැක්වූ බවද එහි යම් අකටයුතුකම් සිදුවන බවත්,පොල කමිටුවක් පවත්වා තිබුණ ද තමන් ඒ සම්බන්ධයෙන් දැනුවත් නොවූ බවත්,පන්නේගමුව හා ඇල්ලගල කොට්ඨාස යම් යම් ව්‍යාපෘති සිදුකළ ද රත්දුණුවත්ත කොට්ඨාසය සම්බන්ධයෙන් සාකච්ඡා නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

ක්‍රියාත්මක කළහැකි සීමාවේ පවතින ව්‍යාපෘති සිදු කිරීමට සැලසුම් කරන බවත්,සෑම කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි යම් යම් ව්‍යාපෘති ඉදිරියේ දී සිදු කිරීමට නියමිත බවත්,පන්නේගමුව පොළ නිරීක්ෂණය පවතින අඩුපාඩු හැකි ඉක්මනින් සකස් කර දීමට කටයුතු කරන බවත් මෙකී සියළුම ඇස්තමේන්තු සකස් කිරීම සිදු කරන්නේ තාක්ෂණික සේවා නිලධාරීන් දෙදෙනා පමණක් බවත් එබැවින් හැකි ඉක්මණින් අදාළ කාර්යයන් ඉටුකිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන සතිය සඳහා සියළුම මන්ත්‍රීවරුන් සම්බන්ධවන ලෙස දන්වමින්, අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්මියටත්, මාධ්‍යවේදී ඒ.ඒ.ප්‍රේමසිරි මහතාටත් , රුක්මන් රත්නායක මහතාටත් ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව.02.00 ට පමණ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ආර්.එම්.චතුරානි වැලිවිහාරේ,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

එච්. එල්. ජයසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
තිස්සමහාරාම.

සභාපති
එච්.එල්.ජයසිරි,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 21 වන දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.